ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ

ඩිප්ලෝමා වැඩ සටහන - 3 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2009/2010

**ESD 1230 – ළමා සංවර්ධනය I**

කාලය - පැය 03 යි.

---

දිනය - 2010.05.16 වේලාව - පෙ.ව. 09.30 - ප.ව.12.30

---

'අ' කොටසේ සියළුම ප්‍රශ්නවලටද 'ආ' කොටසේ තෝරාගත් ප්‍රශ්න තුනකට ද පිළිතුරු සපයන්න.

'අ' කොටස

01. i. විවිධ ආකාරයේ අවධානයන් නම් කරන්න.
    ii. ඉහත නම් කරන ලද අවධානයන් දෙකක් සුදුසු උදාහරණ දක්වමින් කෙටියෙන් පැහැදිලි කරන්න.

02. i. 'ස්ව සම්මානනය' ඔබේ වචනයෙන් පැහැදිලි කරන්න.

    ii. එය 'ස්ව සංකල්පයෙන්' වෙනස් වන්නේ කෙසේදැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

03. i. පරිණතිය සහ ඉගෙනුම අතර ඇති සම්බන්ධය කෙටියෙන් පැහැදිලි කරන්න.
    ii.
    (i) පෙර පාසල් (වයස අවු: 2- 5)
    (ii) ප්‍රාථමික පාසල් (වයස අවු: 6-12)

    යන වයස් කණ්ඩායම්වල ඉගෙනුම සඳහා පරිණතිය බලපාන්නේ කෙසේදැයි පැහැදිලි කිරීම සඳහා උදාහරණ දෙක බැගින් දෙන්න.

04. i. භාෂා සංවර්ධනයේ ප්‍රධාන පදනම් න්‍යාය හතර (04) නම් කරන්න.

    ii. ඉහත එක් න්‍යායකට අනුව ළමයින් තුළ භාෂා ඉගෙනුම සිදුවන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

05. i. මිනිස් මොළය තුළ ක්‍රියාත්මක වන තුන් ආකාර මතක ක්‍රියාදාමයන් නම් කරන්න.

    ii. ඉහත මතක ක්‍රියාදාමයන් නැංවීමේදී ගුරුවරයාගේ භූමිකාව කෙටියෙන් පැහැදිලි කරන්න.

06. i. පියාජේට අනුව ළමයින්ගේ චින්තනයේ පදනම් ගොඩ නැගීම් රටාව කුමක් ද?

ii. ඉහත පදනම් රටාවේ වෙනස්කම් වලට මග පෙන්වන පස් ආකාර ප්‍රජානන ක්‍රියාදාමයන් මොනවාද ?

07. i. 'අවිදුර සංවර්ධන කලාපය' පිළිබඳ අදහස ඉදිරිපත් කළ අධ්‍යාපනඥයා නම් කරන්න.

ii. අවිදුර සංවර්ධන කලාපය යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

08. i. 'ළමයින්ගේ සදාචාර සංවර්ධනය' පැහැදිලි කරන න්‍යායක් නම් කරන්න.

ii. ඉහත න්‍යාය මගින් දක්වන ලද සදාචාර සංවර්ධනයේ ප්‍රධාන මූලධර්ම කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## 'ආ' - කොටස

09. "දක්ෂ යක්ෂයන්" බිහි කරන අධ්‍යාපනයකින් රටක සංවර්ධනයට දායකත්වයක් නොලැබේ.

i. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමයට අනුව ඉහත ප්‍රකාශනය සාකච්ඡා කරන්න.
(ලකුණු 10)

ii. ළමයින්ගේ පූර්ණ සංවර්ධනය දිරි ගැන්වීම සඳහා ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය මගින් යොදා ගත හැකි ක්‍රමවේද තුනක් (03) පැහැදිලි කරන්න.
(ලකුණු 10)

10. i. පියාජේ විස්තර කල පරිදි ළමයින්ගේ චින්තනයේ ප්‍රධාන ගුණාංග දෙක නම් කරන්න.
(ලකුණු 02)

ii. ඉහත ගුණාංග අතරින් එකක් සුදුසු උදාහරණ දක්වමින් විස්තර කරන්න.
(ලකුණු 08)

iii. ගුරුවරියක වශයෙන් ඔබ ළමයින්ගේ චින්තනයේ ගුණාංග ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා අදාල කරගන්නේ කෙසේදැයි උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.
(ලකුණු 10)

11. i. හාවර්ඩ් ගාඩ්නර්ගේ බහුවිධ බුද්ධි න්‍යායෙහි ප්‍රධාන අදහස් පැහැදිලි කරන්න.
(ලකුණු 10)

ii. මෙම අදහස් ප්‍රාථමික පාසල් හෝ පෙර පාසැල් දරුවන්ගේ ඉගෙනුම දිරි ගැන්වීමට අදාල වන අයුරු සාකච්ඡා කරන්න.
(ලකුණු 10)

12. i. ළමුන් තුළ පවතින ස්ව-සම්මානනයෙහි ප්‍රධාන ආකාර දෙක මොනවාද ?
(ලකුණු 04)

ii. ඉහත ස්ව-සම්මානන ආකාර දෙක මගින් මෙහෙයවන ළමයින්ගේ ප්‍රධාන ලක්ෂණ සංසන්දනය කරන්න.
(ලකුණු 08)

iii. ස්ව-සම්මානනයේ ආකාර දෙක සහිත ළමයින් කළමනාකරණයේදී ගුරුවරයාගේ භූමිකාව විශ්ලේෂණය කරන්න.
(ලකුණු 08)

13. i. සුදුසු රූප සටහන් ඉදිරිපත් කරමින් මතක ක්‍රියා දාමයේ ප්‍රධාන අදියර විස්තර කරන්න.
(ලකුණු 10)

ii. පෙර පාසල් ළමයින්ගේ මතක ක්‍රියාදාමය සුසාධ්‍යකරණය සඳහා ගුරුවරියක වශයෙන් ඔබට ගත හැකි ක්‍රියාමාර්ග තුනක් උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.
(ලකුණු 10)

14. i. වර්ධනය හා සංවර්ධනය අතර ඇති වෙනස සුදුසු උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.
(ලකුණු 10)

ii. ළමා සංවර්ධනය හා සම්බන්ධ ප්‍රධාන ගැටළු හතරක් (04) සාකච්ඡා කරන්න.
(ලකුණු 10)

- හිමිකම් ඇවිරිණි. -

THE OPEN UNIVERSITY OF SRI LANKA

DIPLOMA IN EARLY CHILDHOOD AND PRIMARY EDUCATION

PROGRAMME – LEVEL 03

FINAL EXAMINATION – 2009/2010

ESD 1230 - CHILD DEVELOPMENT - I

DURATION: THREE (03) HOURS

Date : 16th May 2010 Time: 9.30 a.m. – 12.30 p.m.

**Answer all questions in Part I and any three (03) questions from Part II.**

**PART - I**

01. i. Name different forms of attention.

 ii. Briefly explain two of the above using appropriate examples

02. i. Explain "self esteem" in your own words.

 ii. Briefly explain how it differs from "self concept"

03. i. Briefly explain the relationship between "maturation" and "learning"

 ii. Give two examples each to explain how maturation influences learning of
 a. pre school children(2-5 years)
 b. Primary school children9 6-12 years)

04. i. Name the four (04) main theoretical bases of language development.

 ii. Explain briefly how language learning takes place in children according to one of the above mentioned theories.

05. i. Name the three types of memory processes

 ii. Briefly explain the role of the teacher in promoting those memory process.

06. i. What is the basic construction of children's thought according to Piaget?

ii. What are the five types of cognitive processes that lead to changes in the basic construction?

07. i. Name the educationalist who described the "Zone of Proximal Development. (ZPD) "

ii. Briefly describe what is "Zone of Proximal Development.(ZPD)"

08. i. Name a theory which explain moral development of children.

ii. Briefly explain the main principles of moral development put forwarded by the above mentioned theory.

(5 x 8 = 40 marks)

**PART - II**

09. An education that produces "clever evils" will not contribute to national development.

i. Discuss the above statement in line with the Sri Lankan Education system.

(10 marks)

ii. Explain three procedures which should be adopted by the Sri Lanka Education System to promote total development of children.

(10 marks)

10. i. Name the two (02) main qualities of children's thought as explained by Piaget.

(02 marks)

ii. Describe one of the above qualities using appropriate examples.

(08 marks)

iii. As a teacher how would you relate the qualities of children's thought to teaching – learning process. Explain with examples.

(10 marks)

11. i. Explain the main ideas of Howard Gardener's theory of multiple Intelligence.

(10 marks)

ii. Discuss the relevance of those ideas to promote learning of pre-school or primary school children.

(10 marks)

12. i. What are the two forms of self esteem existed in children?

(04 marks)

ii. Compare the main characteristics of children governed by the two forms of self esteem.

(08 marks)

iii. Analyse the role of the teacher in managing children with two forms of self esteem.

(08 marks)

13. i. Describe the main steps of the memory process using suitable illustrations.

(10 marks)

ii. Explain with examples three procedures you could adopt as a teacher to facilitate the memory process in pre-school children.

(10 marks)

14. i. Explain the difference between growth and development citing appropriate examples.

(10 marks)

ii. Discuss four (04) main issues related to child development.

(10 marks)

- *Copyrights reserved* –